// emblem is a logo; not added

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/42 - 2012 ඔක්තෝබර් 05 වැනි සිකුරාදා - 2012.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 956 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු බලපත්‍ර ලත් ආයතන විසින් දේශීය වශයෙන් නිෂ්පාදිත ඖෂධීය නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සඳහා හෝ අනුමත කර්මාන්ත හා වෙනත් කාර්යයන් සඳහා හෝ යොදා ගනු ලබන ඊතයිල් මධ්‍යසාර මත බදු**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලද නියමයයි.

මහින්ද රාජපක්ෂ,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 05 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*නියෝගය*

(1) මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ වන භාණ්ඩ මත, එම උපලේඛනයේ II වැනි තීරුවේ නිශ්චිත වශයෙන් දක්වා ඇති ප්‍රමාණයන් මත බද්දක් 2012 ඔක්තෝබර් මස 06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලබන්නේ ය.

(2) වෙනත් කිසිම නිවේදනයක මීට පටහැනිව කිසිවක් සඳහන් වී තිබුණ ද, ඒ බව නොසලකා මෙම බදු ස්ප්‍රීතු ආනයනය කරන ලද වේලාවේ දී හෝ ස්කාගාරයෙන්, තොග ගබඩාවෙන්, දේශීය නිෂ්පාදනාගාරයෙන් මුදා හරින වේලාවේ දී හෝ ගෙවිය යුතු වන්නේ ය.

(3) 2012 මාර්තු මස 30 වැනි දිනැති අංක 1751/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 951 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරමි.

1A - G 16717 — 1,155 (2012/10)

1A - CM 015245 — 1,145 (2012/10)

*උපලේඛනය*

| | *I වැනි තීරුව*<br>*භාණ්ඩය* | *II වැනි තීරුව*<br>*බදු ප්‍රමාණය* |
|---|---|---|
| 1 | රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන සහ රෝහල්, රජයේ දෙපාර්තමේන්තු හෝ වෙනත් අයුරකින් සුරා බද්දට යටත් වූ පානීය මත්පැන් නිෂ්පාදනය සඳහා බලය ලත් නිෂ්පාදකයින් පාවිච්චි කරනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු | නැත |
| 2 | ඖෂධ නිෂ්පාදනය, කර්මාන්ත කටයුතු අපනයනය සඳහා නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා අනුමත ආයතන මගින් යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු සඳහා පහත සඳහන් සීමාවන් අනුව | |
| | (i) මසකට ලීටර් 10,000 දක්වා | තොග ලීටරයකට රුපියල් තුන්සිය හැත්තෑවයි (රු. 370) |
| | (ii) මසකට ලීටර් 10,001 සිට 20,000 දක්වා | තොග ලීටරයකට රුපියල් හාරසිය හැත්තෑවයි (රු. 470) |
| | (iii) මසකට ලීටර් 20,000 ඉක්මවන | තොග ලීටරයකට රුපියල් හත්සිය විස්සයි (රු. 720) |
| | (නැවත ප්‍රතිශෝධන සඳහා යොදා ගනු ලබන ස්ප්‍රීතු සඳහා ද මෙම කොන්දේසි අදාළ විය යුතු ය.) නමුත්, මෙහි ලිටර් 20,000 අඩු සීමාව යටතේ හා ඉහත දැක්වෙන කාර්යයන් සඳහා ස්ප්‍රීතු ආනයනය සිදු කරන්නේ නම් මෙම බද්ද අදාළ නොවේ. | |
| 3 | අශුද්ධ ඊතයිල් මධ්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු / දුර්වල ස්ප්‍රීතු) සඳහා | තොග ලීටරයකට රුපියල් එකසිය පනහයි (රු. 150) |

10 - 909

---

## නිවැරදි කිරීමයි

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත 5 වැනි වගන්තිය යටතේ නියෝගය**

2012 ඔක්තෝබර් මස 04 වැනි දින අංක 1778/32 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* I වැනි කොටස I වැනි ඡේදය-සාමාන්‍යහි උපලේඛනයේ පළමු තීරයේ සහ තුන්වැනි තීරයේ ඇති ''ශ්‍රී ලංකා රජය සතු '' යන වචන ''ශ්‍රී ලංකා රජය සහ හෝ රජයේ පාලනය සතු '' ලෙස නිවැරදි විය යුතුයි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

11-299

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.